# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2366/42 - 2024 ජනවාරි මස 13 වැනි සෙනසුරාදා - 2024.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වන වගන්තිය සමග කියවිය යුතු 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

**හරීන් ප්‍රනාන්දු (පා. ම.),**
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2024 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

වරින් වර සංශෝධනය කරන ලද 2016.10.27 හා අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග පහත පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1. 2022.12.14 දිනැති හා අංක 2310/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සංශෝධිත නියෝගවල 5(2)(V) නියෝගය ඉවත් කිරීම.

2. 2023 මැයි මස 08 වැනි දින අංක 2331/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගවල 8(1)(ආ) නියෝගය ඉවත් කර පහත නියෝගය ආදේශ කිරීම.

**8(1)(ආ) නියෝගය**

එකී අභියාචනය සනාථ කිරීම සඳහා අදාළ සියලු සාක්ෂි හා අනෙකුත් අවශ්‍ය කරුණු ද විෂයභාර අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවන ලද ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පහළොස් දහසක (රු. 15,000) ආපසු නොගෙවනු ලබන මුදල (ක්‍රීඩකයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් වන අභියාචනා හැර) ගෙවූ බවට වන ලදු පතේ මුල් පිටපත ද එම අභියාචනය සමග විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වෙත පිටපත් හතරක් (04) සහිතව ඉදිරිපත් කළ යුතු ය.

අභියාචනා සඳහා ගෙවනු ලබන සියළු මුදල් ජාතික ක්‍රීඩා අරමුදල වෙත බැර කළ යුතු ය.

EOG 01 - 0111

1A - G 41239 — 07 (2024/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*